ඉවත් වනු, ඔබට හැකියාව ඇති දෑ ඔබ පිළිපදිනු. එහෙයින් අල්ලාහ් මත දිවුරා සිටිමි. නුඹලා විඩාවට පත්වන තෙක් අල්ලාහ් විඩාවට පත් නොවෙයි. ඔහු වෙත දහමෙහි වඩාත් ප්රියමනාප වනුයේ එය ඉටු කරන්නා එහි අඛණ්ඩව රැඳී සිටීමය.

ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් වාර්තා කරන ලදී. නියත වශයෙන්ම නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා විසින් වාර්තා කරන ලදී. ඇය සමග කාන්තාවක් සිටියදී එතුමා එය වෙත පැමිණ, මැය කවුරුන්දැයි විමසා සිටියහ. ඇයගේ සලාතය පිළිබඳ සිහිපත් කරමින් ඇය මැය වේ යැයි පවසා සිටියහ. එතුමණෝ, “ඉවත් වනු, ඔබට ශක්තිය ඇති දෑ ඔබ පිළිපදිනු. එහෙයින් අල්ලාහ් මත දිවුරා සිටිමි. නුඹලා විඩාවට පත්වන තෙක් අල්ලාහ් විඩාවට පත් නොවෙයි. ඔහු වෙත දහමෙහි වඩාත් ප්රියමනාප වනුයේ එය ඉටු කරන්නා එහි අඛණ්ඩව රැඳී සිටීමය.“ යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

කාන්තාවක් ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය මුණ ගැසී, තමන්ගේ නැමදුම් හා සලාතය පිළිබඳ මෙනෙහි කරමින් සිටියාය. ආඉෂා තුමිය එය අල්ලාහ්ගේ දූතයාණන්හට -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- දන්වා සිටියාය. එවිට නැමදුමෙහි සීමාව ඉක්මවා යාමත් තමන් ශක්තිය නොදරන දෙයක තම ආත්මය බර කර ගැනීමත් එතුමා ඇයට තහනම් කළහ. එමෙන්ම නියත වශයෙන්ම අල්ලාහ් ඔබ විඩාවට පත් වී අතහැර දමන තෙක් ඔබ වෙහසින් කරන ක්රියාවන් සම්බන්ධයෙන් අල්ලාහ් විඩාවට පත් නොවෙයි. එහෙයින් ඔබට කුසල් හා භාග්යය නිරතුරුව ලබනු පිණිස ඔබ අඛණ්ඩව සිදු කළ හැකි දෙයක් ක්රියාවට නැංවීම අවශ්ය වේ යැයි එතුමා පැවසුහ.

http://www.sunnah.global/hadeeth/si/show/5845